# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1894/18 - 2014 දෙසැම්බර් මස 24 වැනි බදාදා - 2014.12.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජනාධිපතිවරණය - 2015**

### යම් අපේක්ෂකයකු ප්‍රවර්ධනය සඳහා වෙනත් අපේක්ෂකයකු විසින් කරනු ලබන ප්‍රකාශ හා මෙයට පෙර කර ඇති ප්‍රකාශ ප්‍රචාරය කිරීම අත්හිටුවීම

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන හා 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලින් මැතිවරණ කොමිෂන් සභාවට හෙවත් මැතිවරණ කොමසාරිස්වරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු හෙයින් ද, එකී ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධයෙන් බලපවත්නා නීති මගින් පවරා දී ඇති හෝ පනවා දී ඇති බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කල යුතු හා ඉටු කරනු ලැබිය යුතු අතරම සිදුකරනු ලැබිය යුතු ද හෙයින් ඡන්ද විමසීම් පැවැත්වීම එකී බලතලවලට කාර්යයවලට හා කර්තව්‍යවලට ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවන හෙයින් ද යම් ඡන්ද විමසීමක් පැවැත්වීමට අදාළ සියලුම නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම මැතිවරණ කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු හෙයින් ද මෙම ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ඡන්ද විමසීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් ලෙස පැවැත්වීම සඳහා මතු සඳහන් නියම මෙයින් පනවනු ලැබේ."

* තරඟ කරනු ලබන යම් අපේක්ෂකයකු විසින් නාම යෝජනා දිනයෙන් පසුව යම් වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීම සඳහා සිදුකරන ලබන කාර්යයන් පවත්වනු ලබන කථා සම්බන්ධයෙන් ප්‍රවෘත්ති හෝ විශේෂාංග ප්‍රචාරය කිරීමෙන් හෝ දැන්වීමක් ලෙස ප්‍රචාරය කිරීමෙන් හෝ සියලුම මාධ්‍ය ආයතන වැලකී සිටිය යුත්තේ ය.

* තව ද මෙම ජනාධිපතිවරණය සඳහා තරඟ කරන යම් කිසි අපේක්ෂකයකු විසින් නාමයෝජනා භාරදීමට පූර්වයෙන් වූ කාලය තුළ කිසියම් වෙනත් අපේක්ෂකයකු පිළිබඳව කරන ලද ඇගයීමක් ප්‍රවෘත්ති, විශේෂාංග හෝ වෙළඳ දැන්වීම් හරහා එකී ඇගැයීම සිදුකළ අපේක්ෂකයාගේ ලිඛිත එකඟතාව නොමැතිව ප්‍රචාරය කිරීමෙන් වැලකී සිටිය යුත්තේ ය.

මෙම නියම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නිකුත් කරන නියම ලෙස ද මාධ්‍ය උපමාන ලෙස ද සලකා මෙයට අනුකූලව ක්‍රියාකරන ලෙස සියලුම මාධ්‍ය ආයතන හිමිකාරිත්ව වෙත ද මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත ද කාරුණිකව දන්වමි. එසේ ක්‍රියා කිරීමෙන් නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ දෙපාර්තමේන්තුව ගන්නා උත්සාහයට සහායවන ලෙස ඉතා ඕනෑකමින් ද කරුණාවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
මැතිවරණ කොමසාරිස්.

2014 දෙසැම්බර් මස 24 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය.

01-319


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 2304— 102 (2014/12)